ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් සටහන

2026 මාර්තු 24 වන දින ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා අතර පැවති දුරකථන සාකච්ඡාවෙන් අනතුරුව මෙට්‍රික් ටොන් 38,000ක බනිජ තෙල් නෞකාවක් අද දින (2026 මාර්තු 28) කොළඹට ළඟා විය. මෙයින් මෙට්‍රික් ටොන් 20,000ක් ඩීසල් වන අතර මෙට්‍රික් ටොන් 18,000ක් පෙට්‍රල් වේ. 2026 මාර්තු 23 වන දින ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා අතර ද දුරකථන සාකච්ඡාවක් පැවැත්විණ.

2. ලංකා IOC සමාගම මැද පෙරදිගින් සහ සිංගප්පූරුවෙන් මාර්තු මාසය සඳහා ඉන්ධන සැපයුම් ලබා ගෙන තිබිණ. කෙසේ වෙතත්, මැද පෙරදිග කලාපයේ පවතින ගැටුම් හේතුවෙන් මතුව ඇති සැපයුම් බාධාවන් හේතුවෙන් නිෂ්පාදන සැපයිය නොහැකි බව ඇණවුම් ලබා දී තිබූ සැපයුම්කරුවන් ප්‍රකාශ කරන ලදී.

3. මෙම බාධාවන් හේතුවෙන්, IOCL සමාගම විසින් ඉන්දියාවෙන් ඉන්ධන තොග සඳහා ඉල්ලීමක් සිදු කරන ලද අතර මෙට්‍රික් ටොන් 38,000ක මෙම තොගය එම සැපයුම්වල කොටසකි. ඉන්දීය රජය ලංකා IOC සමාගම හරහා ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩව ඉන්ධන සැපයීම සඳහා සහයෝගය ලබා දී ඇත.

***

කොළඹ
*2026* මාර්තු *28*